# නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය,

# සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ පහත සඳහන් කර ඇති පුරප්පාඩු වී ඇති තනතුරු පිරවීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

## 1. සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම් / නඩත්තු) MM 1-1 "කළමනාකාර" සේවා ගණය තනතුරු 01කි.

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සිවිල් ඉංජිනේරු උපාධියක් ලබාතිබීම.

**සහ**

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්ද ලබා තිබීම.

**හෝ**

2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා NVQ හත්වැනි (07) මට්ටමට නොඅඩු සිවිල් ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

සුදුසුකම් ලබාගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක,ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර එක (01) ක පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**හෝ**

2. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ කනිෂ්ඨ කළමනාකාර සේවා ගණයේ (JM) ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහකාර තනතුරක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප :-MM 1-1 – රු.53,175 – 10X1,375 – 15X1,910 = 95,575

**දුරකථන බිල්පත් සීමාවකට යටත්ව ප්‍රතිපූර්ණය කරනු ලැබේ.**

**වයස අවු. 22 ටනොඅඩු අවු. 45 ට නොවැඩි අයවිය යුතුය.**

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.**

## 2. ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහකාර "කනිෂ්ඨ කළමනාකාර" JM 1-1 සේවා ගණය තනතුරු 04කි

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සිවිල් ඉංජිනේරු උපාධියක් ලබා තිබීම. **හෝ**
2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා NVQ හත්වැනි (07) මට්ටමට නොඅඩු සිවිල් ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම. **හෝ**
3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන අදාළ විෂය ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය කුසලතා NVQ හය (06) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකය සම්පූර්ණ කර තිබීම. **සහ**

   සුදුසුකම් ලබාගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්ද ලබා තිබීම. **හෝ**
4. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන අදාළ විෂය ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය කුසලතා NVQ පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකය සම්පූර්ණකර තිබීම. **සහ**

   සුදුසුකම් ලබාගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහය (10) ක පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම. **හෝ**
2. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ (MA 2-2 )II වන ශ්‍රේණියේ විෂය ක්ෂේත්‍රයට අදාළ තනතුරක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප :- JM 1-1– රු.42,600– 10 X 755 – 18 X 1,135 =70,580

**වයස අවු. 22 ට නොඅඩු අවු. 45 ට නොවැඩි අයවිය යුතුය.**

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.**

## 3. පොත් බැඳුම්කරු PL 2 සේවා ගණය තනතුරු 01කි.

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්:-**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් පොත් බැඳීමේ කටයුතු පිළිබඳ නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (NVQ)දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (05)ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/ වෘත්තීය පුහුණු ආයතනයකින් පොත් බැඳීමේ වෘත්තීයට අනුකූලවන, වෘත්තීය පරීක්ෂණයක දී (Trade Test ) දි තහවුරු කෙරෙන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතාවය සහිත ප්‍රාථමික ශිල්පීය නොවන ( PL-1) සේවා ගණයක සේවකයින්. **හෝ**
2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් පොත් බැඳීමේ කටයුතු පිළිබඳ නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

වැටුප - PL – 2- රු.25,750 – 10X270 – 10X300 10X330 –12X350 = 38,950

**වයස අවු. 18 ට නොඅඩු අවු. 45 ට නොවැඩි අයවිය යුතුය.**

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි**

■ ඉහත සඳහන් සියලු තනතුරු සඳහා රජය විසින් අනුමත සියලුම දීමනා සහ ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

**සියලු තනතුරු වලට අදාළ පොදු කොන්දේසි**

**සෑම අයදුම්කරුවෙකුම,**

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
4. මෙම තනතුර ස්ථිර වන අතර විශ්‍රාම වැටුප් රහිතය. සේවක අර්ථසාධක අරමුදලට සේවකයාගෙන් 10% ක් සහ සේව්‍යාගෙන් 12% ක්ද, සේවක භාරකාර අරමුදලට සේව්‍යාගෙන් 3% ක්ද දායකත්වය දරනු ලබයි.
5. රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළයුතු වේ.
6. අයදුම්කරු පිළිබඳ වාර්තා ලබාගත හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.
7. අධ්‍යාපන, වෙනත් සහතික හා පළපුරුද්ද පිළිබඳ සහතික වල ඡායා පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුවේ.
8. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**අයදුම්කළ යුතු ආකාරය**

මේ සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන් අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද සහ පෞද්ගලික තොරතුරු යනාදිය ඇතුළත් ජීව දත්ත සටහන ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරෙහි අයදුම්කරන තනතුර සඳහන් කොට පහත සඳහන් ලිපිනයට 2021.06.23 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ **hr@cma.lk** දරන **E mail** (විද්‍යුත් තැපැල)තැපැල මගින් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන, අපහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති, සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය,**
**1වන මහල, ජාතික නිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල,**
**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ - 2.**